7. ඉන්දියානු අභ්‍යවකාශ පර්යේෂණ සංවිධානය මගින් ක්‍රියාත්මක කරනු ලබන චන්ද්‍ර ගවේෂණ ක්‍රියාන්විත මාලාව (චන්ද්‍රයාන් වැඩසටහන) යටතේ 2023 ජූලි 14 දින අභ්‍යවකාශ ගත කරන ලද යානය 2023 අගෝස්තු 23 දින සඳෙහි දක්ෂිණ ධ්‍රැවය මතුපිටට සාර්ථකව ගොඩබස්වනු ලැබී ය. එම මෑතකාලීන ක්‍රියාන්විතයෙහි නම කුමක් ද?

(1) චන්ද්‍රයාන් - 1 (2) චන්ද්‍රයාන් - 2 (3) චන්ද්‍රයාන් - 3
(4) චන්ද්‍රයාන් - 4 (5) චන්ද්‍රයාන් - 5

8. 2023 ඔක්තෝබර් මාසයේදී පවත්වන ලද 19 වන ආසියානු ක්‍රීඩාවලදී, ශ්‍රී ලාංකික ක්‍රීඩිකාවක් වන තරුෂි දිල්සරා කරුණාරත්න විසින් රන් පදක්කමක් දිනාගත් ක්‍රීඩා ඉසව්ව වනුයේ,

(1) 100 m. (2) 200 m. (3) 400 m (4) 800 m. (5) 1500 m.

9. ගාසා තීරයෙහි බොහෝ සාමාන්‍ය ජනතාව මරණයට පත්කරමින්, 2023 ඔක්තෝබර් මාසයේදී ඊශ්‍රායලය සහ හමාස් සංවිධානය අතර යුද්ධයක් ආරම්භ විය. ගාසා තීරය සමග පොදු දේශ සීමා මායිමක් ඇත්තේ පහත දැක්වෙන කුමන රටට ද?


(1) ජෝර්දානය (2) සිරියාව (3) ඉරානය (4) ලෙබනන් (5) ඊජිප්තුව

10. මානව හිමිකම් ක්‍රියාකාරිනී නාර්ගීස් මොහාම්මදි (Narges Mohammadi) 2023 වර්ෂය සඳහා නොබෙල් සාම ත්‍යාගයෙන් පිදුම් ලැබුවා ය. ඇය පුරවැසියකු වනුයේ,

(1) ලිබියාවෙහි ය. (2) කියුබාවෙහි ය. (3) ඉරාකයෙහි ය.
(4) ඉරානයෙහි ය. (5) පලස්තීනයෙහි ය.

- අංක 11 සහ 12 ප්‍රශ්න පහත දී ඇති තොරතුරු මත පදනම් වේ.

එක්තරා රටක ප්‍රාන්ත පාලක පක්ෂය තෝරා ගැනීම පිණිස පැවැත්වෙන ප්‍රාන්ත මැතිවරණය වර්ෂ 2000 දී ආරම්භ කර, ඉන්පසු සෑම වර්ෂ පහකටම වරක් පවත්වනු ලැබීය. සෑම මැතිවරණයකදී ම *A*, *B* සහ *C* නමැති පක්ෂ තුනක් තරග කළහ. මැතිවරණයේදී කිසියම් පක්ෂයක් ප්‍රකාශිත ඡන්දවලින් 50% කට වඩා ලැබුවේ නම් එම පක්ෂය තනිවම ආණ්ඩුවක් පිහිටුවනු ලබන අතර, එසේ නැතහොත් ආණ්ඩුව පිහිටුවීමට පක්ෂ දෙකක් එකතු වේ. පසුගිය මැතිවරණ පහේදී එක් එක් පක්ෂය ලැබූ ඡන්ද සංඛ්‍යාව සියක් දහස්වලින් තීර ප්‍රස්තාරයෙහි දැක්වේ.




11. එක් පක්ෂයක් අනෙක් පක්ෂ දෙකින් එකක් සමග හෝ හවුල් නොවී තනිව ආණ්ඩුවක් පිහිටුවූයේ කුමන වර්ෂයේ දී ද?

(1) 2000 (2) 2005 (3) 2010 (4) 2015 (5) 2020

12. *C* පක්ෂය වැඩි ම ඡන්ද ප්‍රතිශතයක් ලබාගත්තේ කුමන වර්ෂයේ දී ද?

(1) 2000 (2) 2005 (3) 2010 (4) 2015 (5) 2020

13. 100 m ධාවන ඉසව්වකදී ප්‍රභාත් ධාවන පථයෙහි 90 වැනි මීටරය පසු කරන මොහොතේ ඉදිරියෙන්ම සිටියේ ය. එම මොහොතේදී ප්‍රභාත්ට 1 m පසුපසින් සිටි කුමාර් දෙවැනියා ලෙස සිටියේ ය. ප්‍රභාත් 24 $km\,h^{-1}$ ක ඒකාකාර වේගයක් පවත්වා ගනිමින් සිටියේ නම්, තරගය ප්‍රභාත් සමග එකම වේලාවේදී නිම කිරීමට කුමාර් ඊළඟ 11 m දී පවත්වා ගත යුතු ඒකාකාර වේගය කුමක් විය යුතුව තිබිණි ද?

(1) 24.6 $km\,h^{-1}$ (2) 25.0 $km\,h^{-1}$ (3) 25.5 $km\,h^{-1}$ (4) 26.4 $km\,h^{-1}$ (5) 26.8 $km\,h^{-1}$

14. ජලය රැස් කරන ටැංකියකට කරාම දෙකකින් ජලය ගලා එයි. පළමුවන කරාමය තනිවම ටැංකිය පිරවීමට පැය එකක් ගනී. දෙවන කරාමය තනිවම ටැංකිය පිරවීමට පැය දෙකක් ගනියි. කරාම දෙකම එකම වේලාවක විවෘතව තැබුවහොත් ටැංකිය පිරවීමට ගන්නා කාලය කොපමණ ද?

(1) මිනිත්තු 20 (2) මිනිත්තු 25 (3) මිනිත්තු 30 (4) මිනිත්තු 40 (5) මිනිත්තු 80

15. වර්ෂ 2000 දී අකුම්ගේ පියාගේ වයස අකුම්ගේ වයස මෙන් සිවුගුණයක් විය. අකුම් උපන්නේ 1990 දී නම්, අකුම්ගේ පියාගේ වයස අකුම්ගේ වයස මෙන් දෙගුණයක් වූයේ කුමන වර්ෂයේදී ද?

(1) 2010 (2) 2013 (3) 2018 (4) 2020 (5) 2022

16. සමත් ලකුණ 40ක් වන පරීක්ෂණයකට සිසුහු පස්දෙනෙක් පෙනී සිටියහ. ඔවුන් සියලුදෙනාම පරීක්ෂණය සමත් වූ අතර ඔවුන් ලබාගත් ලකුණුවල එකතුව 205 කි. සිසුන් දෙදෙනකු ඉහළ ම ලකුණ ද, සිසුන් දෙදෙනකු පහළ ම ලකුණ ද ලබාගත්තේ නම්, අනෙක් සිසුවා ලබාගත් ලකුණ කීය ද?

(1) 40 (2) 41 (3) 42 (4) 43 (5) 44

[තුන්වැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

